**මෝල්ටාවේ යුදෙව්වා සහ ආචාර්ය ෆෝස්ටස්** යන නාට්‍යද්වය මගින් ඔහු තත්කාලීන දේශපාලන, සමාජ හා ආගමික පරිහානිය නිර්දය ලෙස විවේචනය කළේය. ඇල්බෙයා කැමූගේ කලිගියුලා නාට්‍යයේ රෝම අධිරාජයෙකු වන කලිගියුලා ද අසාමාන්‍ය චර්යාවන්ගෙන් යුත් කතා නායකයෙකි. පරම නිදහස උදෙසා සියලු සමාජ වටිනාකම් අනිසි ලෙස යෙදවීමට සූදානම් වූවෙකි. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ද අසම්මත වීරයන් සිය නාට්‍ය සඳහා තේමා කර ගත්තෙකි. **සුබ සහ යස** නාට්‍යයේ වීරයා යසලාලක තිස්ස රජු ය. සුබගේ චරිතය නාට්‍ය පුරාවට ම පැතිර ගිය ද, චරිත දෙක අතර සට්ටනයෙන් ඔපවත් වන්නේ යසගේ චරිතය යි. ඔහු අසම්මත වීරයෙකු වන්නේ සම්මත චාරිත්‍රවල අර්ථශූන්‍යභාවය හා අතාර්කික බව ප්‍රකාශ කරන හෙයිනි. එවැනි චාරිත්‍ර අවශ්‍ය වන්නේ ප්‍රයෝගයෙන් රාජ්‍ය පාලනය ගෙන යන්නෙකුට ය. අනුකම්පාව, විශ්වාසවන්ත බව, මානුෂිකත්වය, ආගමානුකූල බව තමන් තුළ තිබේ ය යි දක්වීම රාජ්‍ය පාලකයෙකුට ප්‍රයෝජනවත් බව පෙන්වා දෙන මකියාවෙලී එහෙත් එවැනි සියලු ගුණාංග වගා කර ගැනීම හා ඒවා හැම විටම ක්‍රියාත්මක කිරීම හානිකර බව ද පෙන්වා දෙයි (**මකියාවෙලී,** පරි:අල්විස්, 1999:121) එවැනි ප්‍රයෝගකාරී රාජ්‍ය පාලනයක් ගෙන යාමට අකමැති වූ යස එකී ගුණාංග සැබවින් ම වගා කොටගෙන සිටි පුද්ගලයෙකි. හාස්‍ය ජනක ලෙස හැසිරුණ ද ඔහු උදාර චරිතයකි. උදාර පරමාර්ථයන්ගෙන් යුක්ත වූවෙකි. ඔහු ඛේදයට පත් වන්නේ සම්මතයට සහ ව්‍යාජයට පටහැණි වීමේ හේතුවෙනි.

ඓතිහාසික වෘත්තාන්තයක් සාර්ථක අයුරින් යථාර්ථවාදී රීතියට අනුගත ව රචනා කොට තිබීම ද අවධානයට ලක් විය යුතු කරුණකි. කෙටි ජවනිකා අටකින් සමන්විත නාට්‍යයේ ඉතා දීර්ඝ සංවාද අන්තර්ගත නොවීම ද රසයට හේතු වේ. බ්‍රෙෂ්ට් ප්‍රකාශ කළේ නාට්‍යයකින් විනෝදය මෙන් ම උපදේශය ද ලැබිය යුතු බව යි. **සුබ සහ යස** නාට්‍යයෙන් එකී අරමුණු දෙක ම ඉටු වේ. රජු ඇණුමක් ඇරිය ද 'එසේය මහරජ' යනුවෙන් පවසන ඇමති මණ්ඩලයත්, රජු තුළ නැති ගුණ ගයන වන්දි භට්ටයනුත් ප්‍රේක්ෂකයාට හුරු පුරුදු දේවල් බැවින් ඒ මගින් තම විරෝධාකල්පය ප්‍රකට වීමෙන් ඔවුහු තෘප්තියට පත් වෙති. ගැඹුරු ජීවන අත්දැකීමක් අපේක්ෂා කරන්නන්ට ද මෙම නාට්‍යය ගෝචර වන බව පූර්වෝක්ත විග්‍රහයෙන් පැහැදිලි වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


* **මහාවංසය**, සංස්: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (2003), දෙහිවල, බෞ.ස.ම.
* **කුමාරයා**, නිකොලොයි මකියාවෙලී, පරි: ප්‍රේමචන්ද්‍ර අල්විස්, (1999), කොළඹ 10, සූරිය ප්‍රකාශකයෝ
* නවගත්තේගම, සයිමන්, (2001), **සුබ සහ යස**, කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ


# 8

# පුරාණ ලංකාවේ නෛතික දර්ශනය කෙරෙහි බුදුදහමේ බලපෑම

*මහාචාර්ය පූජ්‍ය කන්දෙගොඩ විමලධම්ම හිමි.*

පෙරදිග ශිෂ්ටාචාරයේ සෑම අංශයක් කෙරෙහි ම ආගමික බලපෑම සිදු වී ඇත. ඒ බව ඓතිහාසික පුරාවිද්‍යාත්මක ගවේෂණයන්ගෙන් මනා ව හෙළි වේ. ආර්යාවර්තයෙහි මූලදේශය හැටියට පිළිගැනෙන ඉරානයේ පැවති සරතුස්තා ආගමේ පයන් වේදාන්ත සම්ප්‍රදාය දක්වා මෙදාතුර පහළ වූ සියලු ම ආගම් මානව ජන සමාජයේ පැවැත්ම උදෙසා චාරිත්‍ර වාරිත්‍ර මත පදනම් වූ නෛතික තත්ත්වයන් කෙරෙහි විශාල වශයෙන් බලපා ඇති බව පෙනී යයි. භාරතයෙහි ප්‍රභවය වූ බුදු දහම තදීය සමාජයට කාවැදී ගියේ ඉතාමත් කෙටි කාල පරිච්ඡේදයකින් බව බෞද්ධ ඉතිහාසය පිළිබඳ විමසා බැලීමේ දී පැහැදිලි වෙයි. වර්ෂ 45ක් පමණ වූ කාලයක් තුළ බුදු රජාණන් වහන්සේ තමන් වහන්සේට ඉඩ ප්‍රස්තා ලැබුණු අවස්ථාවල දී සෑම ප්‍රදේශයක් කෙරෙහි ම මෙන් ම සෑම ජන කොට්ඨාසයක් කෙරෙහි ද අවධානය යොමු කොට ඇත. විශේෂයෙන් එම බුද්ධ චර්යාවෙහි ප්‍රතිඵලයක් වශයෙන් භාරතයෙහි මෙන් ම ලක්දිව ද අනුපම වූ සංස්කෘතික විපර්යාසයන් රැසක් සිදු විය. එම විප්ලවය නෛතික පක්ෂයෙන් ද අගය කළ හැක්කකි.

ක්‍රිස්තු පූර්ව 6වන වර්ෂය වන විට සිරිත රජවුණු බව බෞද්ධ සාහිත්‍යයෙන් ප්‍රකට වෙයි. පරිපාලන ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛත්වය ගෙන සිටි ක්ෂත්‍රිය වංශික ශාක්‍ය කුලයෙන් නිකුත් වූ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ සර්වඥතා ඥානාධිගමනයෙන් ඉක්බිති පූර්ව බුද්ධ කෘත්‍යය දිව්‍ය චක්ෂුරභිඥානයෙන් අවලෝකනය කොට වදාළ බව "පුබ්බේ බුද්ධ කිච්චං ඔලොකෙත්වා" යන පාඨයෙන් පැහැදිලි වෙයි. මේ පූර්ව බුද්ධ කෘත්‍ය විමර්ශනය කිරීම අනෙකක් නොව පෙර බුදුවරයින් විසින් අනුගත සිරිත විමසා බැලීම මැයි, සැකි වහන්දෑ පෙර බුදු සිරිත කෙරෙහි මෙපමණ සැලකිලිමත් ව ඇත්තේ බුද්ධත්වයට පෙර ලබා ගෙන තිබුණු අභ්‍යාස අනුව යැයි කල්පනා කළ හැකිය.

සිරිත කෙරෙහි ඓතිහාසික නයින් අවධානය යොමු කිරීම රාජ්‍යයන්ගේ සාමාන්‍ය සිරිතක් ව පැවති බව මෙයින් පැහැදිලි වන නෛතික හරයයි. මෙවැනි චිරාගත සම්ප්‍රදායානුකූල චාරිත්‍ර ධර්ම තත්කාලීන භාරතීයයන් තුළ කොතෙකුත් පැවතුණි. බිම්බිසාර, පසේනදි කෝසල, අජාසත් වැනි බුද්ධ භක්තික රජවරුන් බුදුරජාණන් වහන්සේ පමණක් නොව අන්‍ය ශාසනික තවුසන්ට ද පුද පූජා සත්කාර පවත්වා ඇත. මේ සකලවිධ කාර්යයන් ඔවුන් වෙතින් ඉෂ්ට සිද්ධ කෙරී ඇත්තේ කඩ නොකර රැකිය යුතු යම් සිරිතක් පිළිබඳ ව පිළිගැනීමක් ඔවුන් තුළ

පැවැති හෙනැයි කල්පනා කරමු. බුදු දහමේ ආරම්භයත් සමග ම මෙම සිරිත් දෙවැදෑරුම් වන බව පැහැදිලි වේ. එනම් ඉපැරණි වෛදික ඉගැන්වීම මෙන් ම පවත්වාගත යුතු චාරිත්‍ර බෞද්ධ සම්ප්‍රදායට අනුව ප්‍රභවය වූ සිරිත් යයි දක්වත හැකිය. මනු නීතිය මහා සම්මත වැනි පැරණි පාරිභාෂික ශබ්දයන්ගෙන් හැඳින්වී ඇත්තේ වේදය ඇසුරින් ගොඩනැඟී තිබුණු නෛතික සංකල්පයන්ය. දසරාජ ධර්ම, දසචක්කවත්තානි, සප්ත අපරිහානි ධර්ම, සත්ත අධිකරණ ධර්ම සමථ වැනි තාක්ෂණ ශබ්දයන්ගෙන් හැඳින්වී ඇත්තේ බෞද්ධ දර්ශනයෙන් ප්‍රභවය වූ නෛතික කරුණුය.

බුද්ධ භක්තිකයෙකු වූ ධර්මාශෝක රජතුමා පැරණි භාරතීය සිරිත්වලට අනුව අභිෂේක ලබා සිටිය දී බොදුනුවකු ලෙස නැවත ද මෞලි මංගල්‍යයක් පැවැත්විය. එය බෞද්ධ චාරිත්‍රයන්ට අනුව සිදු වූවකි. ඒ යුගයේ ම මහා අධිරාජ්‍යයාගේ සන්තානයට පවා කිම්දෙන්නට තරම් විනිවිද යාමේ ශක්තියක් බුදු දහමේ පැවති බව මෙයින් පැහැදිලි වේ. රාජ්‍ය මට්ටමින් ලාංකික රජදරුවන් තුළ ද ධර්මාශෝකයන් කෙරෙහි පැවත ඇත්තේ අසීමිත භක්තියකි. එහෙයින් ම ධර්මාශෝකයන් වෙසසනු ලැබූ දේවානං පිය හෙවත් දෙවන පිය යන අභිධානය ද ලක්රජු විසින් තමනට ආරෝපණය කරගනු ලැබ ඇත. දම්සෝ නරපතීන් වෙත ලක් රජයට පිරිනැමූ ත්‍රිපිටක ධර්මය රාජ්‍ය පාලකයිනගේ මෙන් ම පුරවැසියන්ගේ සිත් සතන් මෙහෙයවීමට තරම් ප්‍රබල වී ඇති සැටි ඉතිහාසයෙන් පැහැදිලි වෙයි. සත්‍ය වශයෙන් ම සාර්ගර්භ වූ සමාජ රටාවක් ලක්දිව ආරම්භ වූයේ මහින්දාගමනයේ සිටය. ඒ වනාහි අනෙකක් නොව බුදු දහමින් ලැබුණු ප්‍රබෝධයයි.

අනුරාධපුරය වැනි නගර පිහිටු වීමේ දී පෞරාණික ඇදහිලිවලට අනුව චිත්තරාජ කාලවේල පච්චිමරාජිනි, වළවාමුඛී වැන්නන් විෂයෙහි ස්ථාන වෙන් කොට තිබීම නගරාභ්‍යන්තරයෙන් ම සිදු වී ඇත. එම පැරණි තත්ත්වය විකාශනය වීමේ ප්‍රතිඵලයක් ලෙස අනුරපුර පොළොන්නරු වැනි යුගයන්හි රජමාලිගාවට සමීප ව ආගමික ගොඩනැගිලි ඉදි වී ඇත. එය රජෙකු විසින් අනිවාර්යෙන් කළ යුතු කාර්යයන් හැටියට සැලකුවාට සැකයක් නොමැත. මෙවැනි සම්ප්‍රදායන් අවිච්චින්න ව පවත්වාගෙන යෑම සඳහා ඒවා අනිවාර්ය කොන්දේසි මත පදනම් වූ නෛතික තත්ත්වයන් හැටියට අවධාරණයෙන් ම කෙරී තිබුණු බව පෙනී යයි. බුදු දහම බෙහෙවින් ජනප්‍රිය වීමේ ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ ගොඩනැගිලි ඉදිකරවීම නගර නිර්මාණකරණයෙහි නියුක්ත සෑම රජෙකු විසින් ම අනිවාර්යෙන් කළ යුතු වූ කාර්යයක් වශයෙන් පැවති බව පූරා විද්‍යාත්මක සාධකවලින් ද ඔප්පු වී ඇත. මේ තත්ත්වය අනුව සලකා බැලීමේ දී පැහැදිලි වන්නේ හුදෙක් පාලන කාර්යය කෙරෙහි පමණක් නොව ඊට අදාළ කේන්ද්‍රස්ථානයන් නිර්මාණය කිරීමේ දී පවා නෛතික මුහුණුවරකින් බුදු දහම බලපවත්වා ඇති බවය.

බෞද්ධ ඉගැන්වීම් සමාජීය වශයෙන් ක්‍රියාකාරී විය. එමගින් සම්ප්‍රදායානුගත නෛතික තත්ත්වයන් නව මගකට යොමු වී නව



සංකල්ප ජනිත වී ඇත. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ක්ෂුද්‍ර යනුවෙන් බෙදා ගෙන තිබුණු සමාජ සංවිධානය "සමානත්තාච ධම්මොච" යන ඉගැන්වීමෙන් ඛණ්ඩනය විය. මෙහි ලා ගෙන හැර දැක්විය හැකි ධම්ම හෙවත් ධර්ම ශබ්දයෙන් සමාජීය වශයෙන් දැක්වෙන පැවැත්ම ගම්‍යමාන වෙයි. එපමණක් නොව ධර්ම ශබ්දයෙන් නීතිය ද අදහස් කරනු ලැබ ඇති බව පැහැදිලිය. මෙයින් හැඟී යන්නේ බුදු දහමින් ලක්දිව සමාජීය ලෞකික පැවැත්ම සඳහා නව නීති සම්ප්‍රදායක් හඳුන්වා දී ඇති බවයි. භාරතයෙහි පැවති තරම් ආගමික සංකීර්ණත්වයක් මෙරට නොපැවතිය ද පැවතියා වූ යම් යම් විෂමතා නැති කිරීම් වස් බුදු සමය බෙහෙවින් බලපා ඇති බව නොවළහා කිව යුතුය.

සමාජ විද්‍යාත්මක වූත් ආචාරවිද්‍යාත්මක වූත් කරුණුවලින් නීතිය වෙන් කොට තැබීම අපහසු කාර්යයකි. ආචාරාත්මක පැවැත්ම කෙරෙහි යොමු වූ සමාජ අවශ්‍යතාවන් නීතිය උදෙසා ම යන නිගමනයෙහි එල්බ ගෙන සිට ශුද්ධ සිද්ධාන්තවාදියෙකු වූ කෙල්සන් පවා විවේචනයන්ට ලක් විය. එහෙත් පෞරාණික බුදු දහමෙන් පිළිබිඹු වන නෛතික තත්ත්වයන් සමාජයෙන් හෝ සදාචාරයෙන් බැහැර වූ ඒවා නො වේ. දඬුවම පෙරදැරි කොට ගත් වරදක් සම්බන්ධයෙන් ඉගැන්වීමක් බුදු සසුනේ දැක ගත නො හැකිය. දඬුවම පැනවුණේ නම් සැබවින් ම ඒ වරදට ඉක්බිතිවමයි. එහෙත් වෛදික ආගමට අනුව වරද සිදු වීමට පළමු ව දඬුවම නියත කොට තැබිණ. ක්ෂුද්‍රයන් විෂයෙහි ආගමික හා සමාජික කටයුතුවල දී විශේෂයෙන් පිළිපදිනු ලැබ ඇත්තේ මේ ක්‍රමයයි. ක්ෂුද්‍රයාට වේදය හදාරන්නට කිසිදු පහසුකමක්වත් සැලසී තිබුණේ නැත. එහෙත් යම් හෙයකින් ක්ෂුද්‍රයෙක් වේද පාඨ කියවීම සිදු කළ හොත් ඔහුගේ ඇස් උපුටා දැමීමටත් දිව කපා දැමීමටත් හැකි වන පරිදි දඬුවම පිළිබඳ ප්‍රඥප්තීන් ඇති කර තිබුණු බව වේදයෙන් පැහැදිලි වේ. අවම වශයෙන් අක්ෂර විද්‍යාව ඉගෙනීමට පවා අයිතිවාසිකම් නොලැබූ ක්ෂුද්‍රයෙකු වේද පාඨ කියවතැයි කෙසේ සිතමු ද? අධ්‍යාපනයට ඇති අයිතිය මනුෂ්‍යයින්ගේ මූලික අයිතිවාසිකමකි. එය පවා අහිමි ව සිටි ජනතාවක් විෂයෙහි ඉහතින් සඳහන් කෙරුණු අන්දමේ දඬුවම් පැනවීම අසාධාරණ බව පසෙකින් තිබිය දී එහි ඇති අක්‍රමවත් බව ඊටත් වඩා හොඳින් ප්‍රකට වන බව සඳහන් කළ හැකිය. එනම් වරදකට ඉක්බිති දඬුවම් පැනවීම වෙනුවට වරද කල් තබා නියම කොට ගෙන දඬුවම් නිශ්චය කිරීමයි. ඒ ක්‍රමයෙහි විචාරශීලී බවක් මෙන් ම අවශ්‍ය ම වූ බුද්ධිගෝචර බවක් දක්නට නො ලැබේ. ඒ වෙනුවට විද්වත් ලෝකයා මවිත කරවනසුලු ප්‍රජාතාන්ත්‍රික ප්‍රගතිශීලී ක්‍රම විද්‍යාවක් බුදු රදුන් විසින් අනුගතය. බුදු දහමින් ප්‍රබෝධයට පත් ලංකා රාජ්‍ය විචාරකයින් විසින් ද මෙය හැකි සෑම අවස්ථාවක දී ම අනුගමනය කරනු ලැබ ඇත. පොළොන්නරුවේ රජකම් කළ ගජබා නිරිඳුන්ට එක් මහලු කාන්තාවකගේ අදෝනාවක් අසන්නට ලැබී ඇත. ඒ මහලු කතට අහිමි වූ පුත්‍රයෙකු පිළිබඳ දුක්මුසු පුවතක් නිරිඳුට ශ්‍රවණය විය. රජු මෙම කාන්තාව ගෙන්වා සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා ඇත. එයින් එළිදරව් වූ කරුණුවලට අනුව මහා සමුද්‍රය තරණය කොට භාරතයට ගොඩ බට

රජතුමා තමන්ට පෙරාතුව රාජ්‍ය විචාළවූවන්ගේ සමයෙහි සිදු වූ සමාජ අත්‍යාචාරයට අන්‍යායට සුදුසු පරිදි ප්‍රතික්‍රියා දක්වා ඇත. එම ප්‍රතික්‍රියාවේ දී පෙර රජදරුවන්ගේ සිරිත කෙරෙහි රජුගේ අවධානය යොමු වී තිබීම ඉතා වැදගත් ය.

රජ දරුවන්ට පෙර රජ සිරිත අවලෝකනය කිරීමේ අභ්‍යාසය ලැබී ඇත්තේ බුදු සිරිතෙන් බව මැනවින් පැහැදිලි වේ. සිරිත රජ වේ (Custom make the law and order) යනුවෙන් නීති විශාරද ඩයිසි විසින් පවසන ලදි. ඒ වනාහි ආදි මිනිසා පිළිබඳ නීතියයි. ලාංකික ආදි පුරුෂයෝ ද සිරිත් විසින් බ්‍රාහ්මණ භාරතීය සම්ප්‍රදායට බැඳී සිටිනා ලදහ. ඒ අනුව කාන්තාවන්ට සීමිත නිදහසක් පමණක් හිමි ව තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. එහෙත් විජයාවතරණය වන විට කුවේණිය විසින් හිමි කර ගනු ලැබූ තත්ත්වය පිළිබඳ කල්පනා කිරීමේ දී යම් විමතියක් පහළ වේ. එතෙකුදු වුවත් විජයගේ ඇවෑමෙන් රජ පදවියට පත් පණ්ඩුවාසදේවයන්ගේ සමයෙහි චිත්‍රාවන්ට හිමි වූ ඉරණම පිළිබඳ සලකා බැලීමේ දී හෙළ කත තෙවන තැනක සිටින්නට ඇතැයි සිතා ගත හැකිය. හුදෙක් පුරුෂයන් පිනවීමත්, දරුවන් රැකබලා ගැනීමත්, මුළුතැන් ගෙයි කටයුතුවල නිරත වීමත් යන සීමිත කෘත්‍යාවලියක සමාජීය වශයෙන් හිමිකම් ලද අවධියෙක සංඝමිත්තා මහ තෙරණියෝ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවක් රැගෙන ලක්දිවට සැපත් වූහ. එතුමියගේ වැඩම වීමෙන් කාන්තා විමුක්තිය උදා වී ඇති බව අනුලා ආදි බිසෝවරුන්ගේ පුවත්වලින් පැහැදිලි වේ. නිදහස පිළිබඳ නෛතික තත්ත්වය පුළුල් අර්ථයෙන් විවරණය වීම සංඝමිත්තාවන්ගේ සම්ප්‍රාප්තියත් සමග ම ආරම්භ වූ සමාජයේ ක්‍රියාවන්ට නෛතික මූලාශ්‍රය බෙහෙවින්ම මුල් වූවාට සැකයක් නොමැත. බෝධිද්‍රැම රාජයන් වහන්සේ මහමෙව්නාවෙහි රෝපණය කිරීමෙන් ඉක්බිති ව අනුරාධපුර යුගයෙහි රාජ්‍ය පදවිප්‍රාප්ත වූවන් විසින් ඉටු කළ යුතු යුතුකම් සම්භාරයට නවාංග රැසක් ම එමගින් එකතු වී ඇත. රාජ්‍යයේ පරමාධිකාරී බලය පිළිබඳ සංකේතය මූර්තිමත් වූයේ බෝධීන් වහන්සේගෙනි. රාජ්‍ය පදවියට පත් වන කුමාරවරුන්ගේ ඔටුනු පැලැඳවීමත්, පළමුවෙනි ආගමික මෙහෙය ඉටු වීමත් බෝ මලුවෙහි ම සිදු කෙරී ඇත. පරසමයවාදී බලවේග නැගී ආ අවස්ථාවන්හි දී ආක්‍රමණකාරීන් වෙතින් බෝධීන් වහන්සේට සිදු විය හැකි උවදුරු සියල්ල නිරාවරණය කිරීම රජුගේ යුතුකම වී ඇත. අනුරාධපුරයෙහි මහාථූපය ඉදිවන තුරු මෙම තත්ත්වය මෙසේ පැවත ඇති බව පෙනේ. කෙසේ වෙතත් දන්ත ධාතූන් වහන්සේ ලක්වැසියනට උරුම වීමට පෙර සිට ශ්‍රී මහා බෝධීන් වහන්සේට පරිපාලන ක්ෂේත්‍රයෙහි හිමි ව තිබුණේ ඉතා වැදගත් ස්ථානයකි. දළදා වහන්සේ උත්තරීතර පූජා වස්තුවක් වශයෙන් පිළිගැනුනායින් පසු ව රාජ්‍ය පදවිය පිළිබඳ හිමිකම් කිව හැකි එක ම සාධකය බවට එය පත්විය. අනුරාධපුර යුගයෙහි පැවැති මෙම චාරිත්‍රය පොළොන්නරුව, දඹදෙණිය වැනි යුගයන්හි ද විශේෂයෙන් දක්නට ලැබේ.

අනුරාධපුර යුගයෙහි නව නීතිරීති පැනවීම සිදු වී ඇත්තේ භාරතයෙන් ලැබුණු බුදු සසුනෙහි ආරක්ෂාව හා පෝෂණය උදෙසාය.



මිස්සක පව්ව ප්‍රාන්තයෙහි මිනිස් වාසයට සුදුසු පරිදි කටාරම් කොටා මැනවින් සකස් කරන ලද ගල්ලෙන් 68ක් පමණ දක්නට ලැබේ. ඒවා මහා සංඝයා වහන්සේගේ ප්‍රයෝජනය පිණිස පමණක් ම වෙන් කරනු ලැබ ඇති බව ඉහත සඳහන් කෙරෙන්නේ "අගත අනගත චතුදිස සගස දිනෙ" යන රාජඥාව මගිනි. ආවාවූත් නාවාවූත් සිව් දිගින් ම වඩමවන මහා සංඝයා වහන්සේ විෂයෙහි එම ලෙන් පූජා කරනු ලැබ ඇති බව ඉහත සඳහන් කරනු ලැබූ ශිලා ලේඛන වාක්‍ය ඛණ්ඩයෙන් පැහැදිලි වේ. ඒ වනාහි පූර්ණ නෛතික ප්‍රකාශනයකි. එම නෛතික ප්‍රකාශනය බිහි වීම පවා සිදු වී ඇත්තේ ආගමික පසුබිමක් ආශ්‍රයෙන් බව වැඩි දුරටත් පැහැදිලි වෙයි. ඉහත සඳහන් කරනු ලැබූ සංයුක්ත වාක්‍ය ඛණ්ඩයෙහි නෛතික පරිපූර්ණත්වයක් ඇති බව කියවිණ. එනම් ඉන් අදහස් කරනු ලැබූ කාරණය ඉතා පුළුල් ක්ෂේත්‍රයක් වසාගෙන පැතිර සිටීමයි. එහි ලා සඳහන් කෙරුණු අගත අනගත සගස යන්නෙන් පැමිණි නොපැමිණි මහා සංඝරත්නය යනුවෙන් අදහස් වේ. එයින් අපේක්ෂිත ව ඇත්තේ අදාළ ස්ථාන පූජා කිරීමේ දී එම අවස්ථාවට සහභාගි වීම සඳහා පැමිණි නොපැමිණි කාලත්‍රයවර්ති මහා සංඝයා වහන්සේ පිළිබඳ ව මෙහි ලා දක්වනු ලැබ ඇති සුවිශේෂ වූ අවධානය නෛතික වශයෙන් ද ඉතා වැදගත් වීමයි.

රෝම නීති සම්ප්‍රදායට අනුව යම් නෛතික ප්‍රඥප්තීන් පශ්චාද්ගාමී (retrospectively) අන්දමින් සිදු කරනු ලැබීම බොහෝ මෑත කාලයට අයත් කටයුත්තකි. එහෙත් ලාංකික පරිපාලන ක්‍රමය බුදු දහමින් ලබන ලද ආභාසය ඇතිව අතීතයට ද බල පවත්වන අන්දමින් නෛතික ප්‍රඥප්තීන් ඇති කර ගනු ලැබීම මූලාශ්‍රගත වැදගත් සිදු වීමක් හැටියට සඳහන් කළ හැකිය. අනුරපුරයෙන් ඇරඹුණු මෙම නෛතික සම්ප්‍රදාය පොළොන්නරු යුගයේ දී ද මැනවින් ක්‍රියාත්මක වී ඇත. ඒ මඟ ඔස්සේ සිංහලයේ අවසන් රජු දක්වා ම පූර්වෝක්ත තත්ත්වය පැවති බව ස්ඵුට වෙයි.

රජ යනු පැරණි නෛතික පාරිභාෂික ශබ්දයකි. සියලු කෙලෙසුන් නසා බුද්ධත්වයට පත් නික්ලේශී උත්තමයන් වහන්සේ හැඳින්වීම සඳහා ද බුදුරජ, බුදුරජාණන් වහන්සේ යන පද භාවිත කරනු ලැබේ. බුදු පදවිය ලෝකෝත්තර තත්ත්වයකි. රජ පදවිය ලෞකික තත්ත්වයකි. බුදුරජ නමැති පදවිය ලොව්තුරා නෛතික සාරයේ අග්‍රඵලයකි. බුද්ධත්වය අලෞකික වූ නිසා ම ඵලයන් අබිබවා යයි. නමුත් රජ පදවියෙහි කාල නියමයක් ඇත. එය බලපවත්වන නිශ්චිත අවකාශයන් පිළිබඳ (දේශ) සීමා පිළිබඳ වූවක් ද වෙයි. චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ යන පරමාර්ථ ධර්මයන් පිළිබඳ පිරිසිඳ දත්තා වූ ඥානයෙන් අග්‍රප්‍රාප්ත බුදුරජාණන් වහන්සේ සර්වකාලීන මානව චින්තනයට හා චේතනාවට බලපවත්වන දහමක් දේශනා කළ සේක. එය නෛතික වැනි අංශයන් කෙරෙහි බලනොපාන ලදැයි කෙසේ නම් කිව හැකි ද?

ලෝකයේ පෙර'පර දෙදිගම විසූ සෑම රජකු විසින් ම අධිකරණ විනිශ්චයෙහි ලා චේතනාව පිළිබඳ සැලකිලිමත් වී ඇති බවක් දක්නට

ලැබේ. අද්‍යතන නීති ශාස්ත්‍රයෙන් ද සාවද්‍ය ක්‍රියාවන් පිළිබඳ කෙරෙන විභාගයක දී චේතනාව කෙබන්දක් දැයි විමසා බැලේ. එහෙත් නූතන නීතිවේදීන්ට චේතනාව නිර්වචනය කිරීම එතරම් සූකර කාර්යයක් වී නොමැත. බුදුරජාණන් වහන්සේ විසින් "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" යන එක ම ප්‍රස්තුතයකින් චේතනාවට නිර්වචනයක් සපයනු ලැබේ. එයම ප්‍රතිගම්‍ය ස්වරූපයෙන් ඇරිස්ටෝට්ල් විසින් ද නිර්වචනයක් සපයනු ලබයි. මේ වනාහි ඇරිස්ටෝටලියානු දර්ශනයට අනුව පැහැදිලි කර ගත හැකි සමබල ප්‍රස්තුතයකි. (equal preposition) (P^q)=(q^p) double implication) මෙවැනි තාර්කික ප්‍රකාශනයන්ගෙන් පිරිපුන් මුල් බුදුසමය ආදි මිනිසා පිළිබඳ නීතිය හැඩගැස්වීමෙහි ලා වෙසෙසින් මහෝපකාරී වෙයි.

සාමාන්‍ය නීති මෙන් ම රාජ්‍ය පරිපාලනය කෙරෙහි නෛතික සංකල්පයන් කෙරෙහි ද බුදු සමයේ ආභාසය නොමඳව ලැබෙන්නට ඇතැයි කල්පනා කළ හැකිය. නීතිය මිනිසුන් අතර පවත්නා මතභේද හටගත් ආකාරයෙන් ගැටලුව සංහිඳියාවකට පත්කර ගත යුත්තේ සාමකාමී සහජීවනයෙන් යුත් සමාජයක් බිහි කිරීමේ අරමුණින් යුතුවය. ඉහත සඳහන් කරනු ලැබූ ගැටලු සහගත අවස්ථාවන් මිනිස් සන්තානයෙහි ජනිත වන්නේය. බුදුරජාණන් වහන්සේගේ නේතෘත්වය පිළිගත් ජන සමූහයා අතිවිශාලය.

උන්වහන්ස් ගම් නියම්ගම් ඇසුරෙහි තැනින් තැන නවාතැන් ගනිමින් ලෝක සත්ත්වයාගේ හිතසුව පිණිස සංචාරය කළේ බොහෝ සෙයින් සපිරිවරින්මය. නානත්ත කායා නානත්ත සඤ්ඤා ආදි පුද්ගල ප්‍රඥප්තීන් විවරණයෙන් සමාජය නිර්වචනය කළ බුදුපියාණන් වහන්සේ එවන් සමාජයකට අයත් පිරිසක් පරිහරණය කිරීමේ දී ආදර්ශමත් පාලකයාණ කෙනෙක් වූ සේක. වහන්දෑගේ පර්ෂදය වර්ණනා කෙරෙන කොසොල් මහරජු මවිතයට පත් වෙයි. එහෙයින් කියන ලද මැයි. " සමග්ගා සම්මෝදමානා ඛිරොදකි භූතා මිගභූතේන චේතසා....." සමගි සම්පන්න වූවා වූ ප්‍රිය වචන ඇත්තාහු දියට වන් කිරි සේ මුව පොව්වන් සේ යනාදි වශයෙන් ඒ බුද්ධ පර්ෂදය මෙවන් වැනුමකින් පසසන්ට තරම් උදාරතර වූයේ එහි ක්‍රියාත්මක වූ ආචාර සමාචාර ගුණ නුවණ මෙන් ම නෛතික ක්‍රමයෙහි සම්භාවනීයත්වය කරණ කොට ගෙනමය.

අවංකභාවය හා නිර්ව්‍යාජත්වය වැනි අත්‍යවශ්‍ය සමාජ ධර්මතාවන් බුදුරජාණන් වහන්සේ ගොඩනගා ගත් ආකාරය පිළිබඳ ව සංඝ සමාජයෙන් මැනවින් පිළිබිඹු වෙයි. උන්වහන්සේගේ ධර්ම කරුණු විමසා දැන ගැනීමට පැමිණි දම් සව්වෝ යම් යම් කරුණු පිළිබඳ සාකච්ඡා පවත්වමින් සිටිති. දම් දෙසීම සඳහා බුදු රජාණන් වහන්සේ මණ්ඩපයට වැඩම කළ පසු සිරිතක් වශයෙන් මහණෙනි, "මා එහි ඒමට පෙර කිනම් කථාවකින් යුක්ත වූයේ දැයි" විමසන සේක. අවංකභාවය මෙන් ම නිර්ව්‍යාජත්වය මූර්තිමත් කළ මහ සඟරුවන බුදුරදුන් වැඩම වීමට පෙර සාකච්ඡා වෙමින් පැවති සියලු දේ නොවළහා නොසඟවා ප්‍රකාශ කරති. වරෙක බුදුරජුන්ගේ සමීපතම ඥාතිවරයෙකු වූ



ථුල්ලතිස්සයන් පිළිබඳ පැමිණිල්ලක් විය. එහි ප්‍රතිඵලයක් වූයේ ප්‍රසිද්ධ නඩු විභාගයක් පවත්වා ථුල්ලතිස්සයන් යහමඟට (නිවන් මඟට) යොමු කරවීමය. තව දිනෙක සර්පයෙකු විසින් දෂ්ට කොට ජීවිතක්ෂයට පත් වූ භික්ෂුවක් පිළිබඳ ප්‍රවෘත්තියක් සැල විය. තව දිනෙක එදින සකලවිධ සර්ප යෝගී උරග ගෝත්‍රික ජීවීන් කෙරෙහි මෙත් වැඩිය යුතු ආකාරය දේශනා විය. කුමාර කාශ්‍යප මාතාවන් ගිහිකල දරු ගැබක් ප්‍රතිෂ්ඨාපිත වූ පසු භික්ෂුණී ශාසනයේ පැවිද්ද ලැබූවාය. සැබවින් ම ගැබිණියක වූ ඇය සමාජ අවමානයට පාත්‍ර විය. මේ පිළිබඳව බුදුරජාණන් වහන්සේ වෙත පැමිණිලි ගලා එන්නට විය. අකම්පිත බුදුරජාණෝ එම කාරණය විෂයෙහි නෛතික ක්‍රියාමාර්ගයකට පිළිපන්හ. තමන් වහන්සේ එම නඩුව විභාග කරන්නට විනිශ්චයකරු වශයෙන් ඉදිරිපත් වීම නුසුදුසු යැයි වදාළ සේක් අදාළ කාරණය පිළිබඳ ව මැදිහත් ව විමසා බලා තීරණයක් හෙවත් විනිශ්චයක් ඉදිරිපත් කරන හැටියට විශාඛාවන් පත් කොට වදාළ සේක. අද්‍යතන නීති විද්‍යාවෙහි ද එවැනි ප්‍රශ්න පිළිබඳ ව අනුගමනය කරන ක්‍රියා මාර්ගයන් ද එබඳුමය. ක්‍රි.පූ. 6වන සියවස වැනි පැරණි යුගයක දී පවා අද්‍යතනයෙහි භාවිත කරනු ලබන නීති සම්ප්‍රදායන් පැවති බව මෙයින් පැහැදිලි වෙයි. මේ අනුව විමසා බලන විට බුදුරජාණන් වහන්සේගේ එම නෛතික ක්‍රියාවලිය ග්‍රීක රෝමයන්ට වඩා වෙසෙසින්ම ප්‍රබුද්ධ බව සැලකිය හැකිය.

බුද්ධකාලීන සමාජ පරිපාලනය පිළිබඳ සලකා බැලීමේ දී එම ක්‍රමය වැඩවසම් ක්‍රමයක් යැයි හැඳින්වීමට පුළුවන. නූතන දේශපාලන විද්‍යාත්මක පරිභාෂික ශබ්දයක් වූ වැඩවසම් ක්‍රමය යන්නෙන් අදහස් කෙරෙන ගුණාත්මක වූත් ප්‍රමාණාත්මක වූත් සියලු ම දේ එවක සමාජයෙන් පිළිබිඹු විණැයි සඳහන් කිරීම අපහසුය. එහෙත් එවන් සමාජයක් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වූ නෛතික දෘඪ බව මැනවින් ඉස්මතු ව පෙනෙයි. සාහිත්‍යානුගත ව්‍යාඛ්‍යානයන්ගෙන් පැහැදිලි වන ආකාරයට නෛතික සියලු තත්ත්වයන් පැවත ඇත්තේ විධායක බලතල හිමිවූවන්ගේ සිත් සතන් පිනවීම සඳහා ය. බියජනක වූ දඬුවම් ක්‍රමවලින් සමන්විත වූ නෛතික දර්ශනයේ ප්‍රායෝගික අංශයන් නිසා එය අධ්‍යයනයට ප්‍රියජනක වූ විෂය ක්ෂේත්‍රයක් බවට පත් වී නොමැත. බුදුරජාණන් වහන්සේ පවා දඬුවම සියල්ලන්ට ම බිය එළවනසුලු වූ ක්‍රියාමාර්ගයක් හැටියට උගන්වා ඇත.

සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනෝ
අත්තනාං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ

සියලු දෙනා දඬුවමින් ත්‍රස්ත වෙති. මරණයට බිය වෙති. තමා උපමා කොට ගෙන අනුන්ට හිංසා නොකළ යුතුයි. ඝාතනය නොකළ යුතුයි. නීතියේ ප්‍රධානතම ඉගැන්වීමක් වන දඬුවම පිළිබඳ සංකල්පය බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් මෙසේ පිළිකුලට භාජනය වී ඇත. ඒ පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කිරීම සාමාන්‍ය ජනතාව විසින් අත්හරිනු ලැබ ඇත්තේ මේ නිසා යැයි කල්පනා කළ හැකිය. පැවති ක්‍රමය තුළ ම විකාශය වූ බෞද්ධ න්‍යාය මාර්ග විසින් නෛතික ඒකාධිකරයට හිමිකම්

කී නේතෘ ජනයින් තුළ, යම් මෘදු මොළොක් බවක් ඇති කරවනු ලැබීය. ඒ බුදු දහම මූලික කොට ගෙන ඇති දේශනාවන්හි ලා අවධාරණයෙන් සඳහන් කෙරෙන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන චතුර්විධ බ්‍රහ්මචාරී චර්යා ධර්මතාවන් නිසා ම සිදු වූ වෙනසකි.

පොළොන්නරු සහ දඹදෙණි යුගයන් වන විට ලාංකික ජන සමාජයේ බෙහෙවින් ම ජනප්‍රිය වූ අධ්‍යාත්මික අංගයකි බුදු දහම. බුදු දහම ප්‍රථමයෙන් ම පිවිස ගත්තේ ලාංකීය රාජන්‍යයන්ගේ සන්තානයට බව මහින්ද මාහිමි දෙවන පෑ තිස් රජුන් හමුවෙන් පැහැදිලි වෙයි. බුදු දහම රාජකීය හදවත් හමුවෙහි වසා පැතිර සිටි හෙයින් අධිකරණ ක්‍රියා මාර්ගයන්හි දී පෙර පැවති දරදඬු බව තුනී වී ගොස් ඇත. බුදු රජාණන් වහන්සේ මානව හිතවාදියෙකු පමණක් නොව සර්ව සත් හිතවාදියෙකි. උන්වහන්සේ නිරතුරු ව ම "සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා" යනුවෙන් සියලු සත්ත්වයන්ගේ සුවය අපේක්‍ෂා කළ සේක. එවන් දහමක ආශිර්වාදය ලද විධායකත්වයක් ආශ්‍රයෙන් මැදිහත් බව මැනවින් පිළිබිඹු වෙයි. එය අධිකරණමය ක්‍රියාවන්හි සාධාරණත්වය විෂයෙහි ද බෙහෙවින් බලපවත්වනු ලැබීය.

මේ සාධාරණය ඉටු කිරීමේ වස් අනුගත නෛතික ක්‍රියාමාර්ගයන්හි ලා මැදිහත් වූ අධිකරණ සමතයන් කොතෙකුත් දැනගත හැකිය. බුදු සසුනේ පැවැත්ම විනය මත රඳා පවතී. (විනයො නාම සාසනස්ස ආයු) මේ වනාහි බුදු රජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේ විෂයෙහි පැනවුණු නීති සමුදායකි. යථෝක්ත විනය ප්‍රඥප්තීන්ට අනුව කෙරුණු නෛතික කාර්යයන් විනය කර්ම යනුවෙන් හැඳින්වී ඇත. විනය කර්මයන්ට බලපවත්වන ලද රෙගුලාසි ගණනාවක්ම වෙයි. අවශ්‍ය ගණපූරණය එහි වැදගත් ම අංගයයි. අද්‍යතන මූලික කරුණක් වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ දී රජතුන් කට්ටුවකින් සමන්විත වීම පිළිබඳ අවශ්‍යතාව ද ගණපූරණය පිළිබිඹු කරන්නකි. එමගින් ප්‍රකට විය යුත්තේ ද සාධාණීකරණය පිළිබඳ න්‍යායයි.

භික්ෂූන් වහන්සේ විසින් කරන ලද විනය කර්මයන්හි ලා වරද කළවුන් පිරිසිදු කිරීමත් සුපුරුදු පරිදි දඬුවම් පැමිණවීමත් සිදු වී ඇත. විනය විරෝධී ක්‍රියාවන්හි නිරත වූ ශ්‍රමණයින් හැඳින්වීම සඳහා අලජ්ජී යන නාම පදය භාවිත විය. අ+ලජ්ජී, අ +ලජ් + ඉ = අලජ්ජී මෙවන් පද සංයෝජනයකින් නිපන් අලජ්ජී ශබ්දයෙන් නීතියට පිටුපාන ලද සදාචාරයට පටහැණි වූ පුද්ගලයින් යන්න අදහස් වී ඇත. අලජ්ජී භික්ෂුවක පිළිබඳ පරීක්‍ෂණයක් පැවැත්වෙන අවස්ථාවේ දී පරීක්ෂක තත්ත්වයෙන් ඉදිරිපත් වන භික්ෂූන් වහන්සේ ස්වයං විවේචනයකින් ඉක්බිති ව හෙවත් ඔවුනොවුන් ඇවැත් දෙසා ගැනීමෙන් පවිත්‍රත්වයට පත් ව එමගින් ලජ්ජීන් හැටියට හෙවත් නීතිගරුක ලජ්ජාශීලි ශීලාචාර පුද්ගලයින් ලෙසට පත් වෙත්. මෙහි දී ඔප්පු වී ඇත්තේ සුළු වරදක් වෙයි නම් ඊට අනුරූප ව අවවාද අනුශාසනා පැවැත්වීම සිදු වන බවය. මේ අවවාද දානයෙහි ලා අවවාද දායකයා ඊට සුදුසු ප්‍රතිරූපකයෙකු විය යුතු බව මුල් බුදු සමයට අනුව පැහැදිලි වෙයි.



අත්තානමේව පඨමං - පතිරූපෙ නිවේසයෙ
අථඤ්ඤමනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතො

පළමු කොට තෙමේ ම සුදුසු තත්ත්වයෙහි පිහිටා ඉක්බිති ව අන්‍යයන්ට අනුශාසනා කළ යුතුය. එසේ කරන පඬිවරයා කිසි කලෙකත් කෙලසීමට පත් නො වේ. මෙයින් ආභාසය ලද සුභාෂිත කතුවරයෝ "ඔවා දෙනු පරහට තමා සම්මතයෙහි පිහිටා සිට" යනුවෙන් සඳහන් කළහ. මෙහි දැක්වෙන සම්මතයෙහි පිහිටීම නෛතික වශයෙන් නිරවද්‍ය පුද්ගලයෙකු වීම බව සඳහන් කළ හැකිය. භික්ෂූන් වහන්සේ සංඝ සමාජය තුළ යම් ගැටලු සහගත තත්ත්වයන් ඇති වූ අවස්ථාවන්හි දී පොහෝ සීමාවන්ට එක්රැස් ව ඇවැත් දෙසා ඔවුනොවුන් පවිත්‍ර ව සම්තයෙහි පිහිටා ගනිති. මෙයින් ආභාසය ලද රජවරුන් ද ඔවුනොවුන්ගේ නිරවද්‍යවූත් හැසිරීමෙන් යුක්ත ව සිට අධිකරණ කාර්යයන්හි නිරත වී ඇත. මේවායින් පැහැදිලි වන්නේ මැදිහත් බවමය.

ත්‍රිපිටාකාගත අධිකරණ තොරතුරුවලින් පෙනී යන ආකාරයට අපේ රජදරුවන් කෙරෙහි එය බලපවත්වනු ලැබ ඇතැයි කල්පනා කළ හැකි කරුණු අපමණය. සංඝ සමාජයේ යම් සාමාජිකයෙකුට එරෙහි ව යම් චෝදනාවක් එල්ල කරන්නේ නම් එය ඉතා ප්‍රවේශමෙන් කළ යුතු ව ඇත. විනය පිටකයට අයත් **පරිවාර පාලි** මූල ග්‍රන්ථයෙහි දක්නට ලැබෙන ආකාරයට යම් චෝදනාවක් නැගීමේ දී එහි පරිපූර්ණත්වය මූල, වස්තු, භූමි යන අංග තුන මත රඳා පවතියි.

මෙහි සඳහන් කෙරුණු මුල අවම වශයෙන් එකක් විය හැකි අතර උපරිම වශයෙන් අනේකවිධ විය හැකිය. චෝදනාවක දැකිය හැකි සමුලික බව වැදගත් වෙයි. යම් චෝදනාවක් අමූලික වෙයි නම් එය ආරම්භයේ දී ම නිෂ්ප්‍රභ වෙයි. සමූලිකබව හෝ අමූලිකබව රඳා පවතින්නේ වස්තුව මතය. එනම් දිට්ඨි, සුත, පරිසංකිත වශයෙන් ගෙනහැර දැක්වීමයි. දිට්ඨි නම් ඇසින් දකින ලද බවයි. සුත නම් කණින් අසන ලද බවයි. පරිසංකිත නම් සැක සහිත බවයි. අද්‍යතනයෙහි ව්‍යවහාර වන රෝම ලන්දේසි නීතියට අනුව යම් පුද්ගලයෙකුට එරෙහි ව චෝදනාවක් කෙරෙන්නේ නම් එම චෝදනාවෙන් ප්‍රකාශ කෙරෙන කාරණය පිළිබඳව සැක කරන බව අධිකරණය ඉදිරියෙහි සැලකර සිටීමත් සිදුවෙයි. පැරණි බුදු දහමෙහි දැක්වෙන පරිසංකිත තත්ත්වයෙන් පරි+සංකා+ඉක, පරිකංඛ= කංඛණෙ ඉකුපරි+සං+කංඛ ඉක පරිසංඛිත = පරිසංඛිත යන්නෙන් පරි හෙවත් මත රඳා පවත්නා සැකයෙන් යුක්ත බව අදහස් වෙයි. මේ නම් චූදිතයා මත රඳා පවතින සැකමුසු සහගත බවයි. නිරුක්ති නයින් විශ්ලේෂණාත්මක ව නිර්වචනය කිරීමෙන් පැහැදිලි කර ගත හැකි පෞරාණික නෛතික දර්ශනයට අයත් සංකල්පය බෙහෙවින් සංඝයා අතර යම් චෝදනාවක් නැගෙන්නේ නම් එම චෝදනාව ඉදිරිපත් කරන්නා කාය වාග් සමාචාරයෙන් යුක්ත ව මෛත්‍රී චින්තාවන්ගෙන් සමන්විත බහුශ්‍රැත ධර්මධර භික්ෂූ එසේම භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයෙහි හසළ දැනුමක් ඇති පුද්ගලයෙකු විය යුතුයි. රාජාධිකරණය ඉදිරියෙහි යම් චූදිතයෙකු පිළිබඳ

සැල කරන්නෙකු කෙරෙහි ගෘහස්ත ජීවිතයට අනුරූපී ව තිබිය යුතු සංවරභාවයන් විශේෂ වශයෙන් සලකනු ලැබූවාට සැකයක් නොමැත. එසේ වීමට ඇති සම්භාවිතාව අති විශාලය. එය අනෙකක් නිසා නොව මහා සංඝයා වහන්සේ හා රජ පවුල අතර පැවති දැඩි සම්බන්ධතාව නිසාමය. භික්ෂූන් වහන්සේ රජුන්ට පුරෝහිතකම් නොකළ ද කුලදේවතා යන අභිධානයෙන් පැසසුණු වහන්දෑවරු රජුන්ගේ පූජනීය අනුශාසකයෝ වූහ. එහෙයින් ම ඒ යුගයන්හි දී නීතියේ පැවැත්මත් සංවර්ධනයත් උදෙසා බුදු දහමෙන් නොමඳ බලපෑම් ලැබෙන්නට ඇතැයි කල්පනා කිරීම යුක්ති සහගත වෙයි.

### පාදක සටහන්

1. What the great religions believe, Joseph Gaer, New Amarican Library, Asignct Book, New York p162
2. **දීඝ නිකාය**, මහා පරිනිබ්බාන සූත්‍රය, අංගුත්තර නිකාය, සත්තක නිපාත
3. **පපඤ්ච සූදනී.**, ම. අ. සාමගාම සුත්ත වර්ණනා
4. **මහාවංසො**, පොල්වත්තේ බුද්ධදත්ත මාහිමි සංස්කරණය, පරි II, ගාථා I
5. **මහාවංසො**, පරි. 10, ගාථා 4.
6. **අංගුත්තර නිකාය**, පංචක නිපාත, මධුරාදීනව සූත්‍රය
7. **මහාවංසො** පරි. 18, ගාථා 40
   ලංකාදීපං යදි ඉතො ගන්තබ්බං උරුබෝධියා,
   බබෙමමතිකො බුද්ධස්ස සාසනම්හි සචෙ අහං
8. මිහින්තලා ලෙන් ලිපි (පූර්ව බ්‍රාහ්මී යුගය)
9. **විශුද්ධිමාර්ගය**, ඒ.පී. ද සොයිසා සංස්කරණය, සවස් පිට 787 අභිධර්මාර්ථ සංග්‍රහය, චිත්ත චෛතසික කාණ්ඩය.
10. **සංයුක්ත නිකාය**, කෝසල සංයුක්ත
11. වර්තමාන පරිපාලන නීතිය විෂයෙහි එම ස්වාභාවික නීති න්‍යායයට සෑම අතින්ම අදාළ වූ ආකාරයට සංඝාධිකරණයේ කටයුතු කෙරී ඇති බව පෙනේ. කිසි ම පුද්ගලයෙකු තමාගේ ම ප්‍රශ්නයක දී තමා විසින් ම විනිශ්චයක් ලබාගත යුතු නො වේ.
12. **ධම්මපදය**, දණ්ඩවග්ගො 1.
13. **විමානවත්ථු**, මහාරථවග්ගයෙහි කරණීය මෙත්ත සූත්‍රය.
14. **ධම්මපදය**, අත්තවග්ගො 2

# 9

## Mädawala Vihāraya revisited

***Professor Asoka de Zoysa***

The Murals of the *Mädawala Raja Mahā Vihāraya* have been subjected to much scholarly research.

**Foot Note 1 -** The name of the *Vihāraya* is derived from the location, as the temple is situated in the village of Mädawala, 290 meters beyond the Mädawala Bazaar about 9 km from kandy. It can be approached from Kandy along the Katugastota-Ranavana Road.

The importance of the murals was evident. In 1964 the Art Series of the Archaeological department (of Sri Lanka) dedicated its 3rd volume to the temple and the Archaeological Survey of Sri Lanka in its series "Paintings of Sri Lanka" in 1990 published details of the murals and main alter GODAKUMBURA (1964) and CUTIWONGS-PREMATILLEKE-SILVA (1990a). Senake Bandaranayake's study "The Rock and Wall Paintings of Sri Lanka" (1986) followed by Marie Gratellier's monograph in two volumes "Peintures Murales du Sri Lanka" Ecole Kandyak XVIII-XIX siecles" (1991) and Gamini Jayasinghe's "Sri Lankan Buddhist Art. Post classical Revival" (2006) have discussed the style and subject mater of the murals in the context of early Kandyan Art in Buddhist temples.

This very valuable research has laid a solid foundation for futher research to identifying the images. Nevertheless, very little attention has been paid to question the choice of the images, relating their position in the limited space of the new type of "*Tämita Viharaya*" and allocation of space to deferent genres of images. The motivation behind the selected iconographic program in the limited space measuring 3.6 x 1.5 meters in this single room of the *Tämita Vihāraya*, will as such the key interest of this research paper.

**Foot Note 2 -** This type of single room very small image house emerges in the early Kandyan Era. It is a wooden superstructure surmounted on short stone pillars. The murals in the inner room or sanctum have a very rigid special arrangement. One can view the central seated image of the Buddha under a "Makara Arch" attended by fly whisk bearers and deities on entering through the doorway. The side wooden walls and ceiling have almost similar picture programs. The earliest example of a *Tämita Vihāraya* can be seen at Mädawala. Similar narrative cycles